# ගා/ මාපලගම සිරිසුනන්ද මහා විද්‍යාලය

## බුද්ධ ධර්මය

**8 ශ්‍රේණිය** **පළමු වාර පරීක්ෂණය - 2022** **කාලය පැය - 1. වි 30**

**නම:** .............................................................................................................................................

**I කොටස**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. කාන්තාවන්ට පැවිදිබව ලබා ගැනීමේදී පිළිපැදිය යුතු බුදුන් වහන්සේ වදාළ ධර්ම කරුණු වන්නේ,
(1) අෂ්ඨලෝක ධර්ම (2) අෂ්ඨ ගරු ධර්ම
(3) අෂ්ඨ සමාපත්ති (4) ආර්ය අෂ්ඨාංගික මාර්ගය

02. සෝණදණ්ඩ බමුණාගේ ප්‍රකාශයට අනුව බුදුරජාණන් වහන්සේ "සම්මෝදකය" යන්නෙන් අදහස් වන්නේ,
(1) සතුටු සාමීචි ඇත්තෙකි. (2) විවෘත කතාබහ ඇත්තෙකි.
(3) කනට සුව එලවන කතා ඇත්තෙකි. (4) පළමුවෙන්ම කතා කරන්නෙකි.

03. අනාථපිණ්ඩික සිටුවරයාට බුදුරජාණන් වහන්සේ මුණ ගැසුණේ,
(1) කුසිනාරාමයේදී ය. (2) රජගහනුවරේදී ය.
(3) සීමා වනයේදී ය. (4) අම්බට්ඨ වනයේදී ය.

04. ආර්ය තුෂ්ණිම්භාවයෙන් වාසය කිරීම යනු කුමක් ද?
(1) ඝෝෂා කිරීමයි. (2) දැහැමි කතාවයි. (3) නිහඬ බවයි. (4) වාද කිරීමයි.

05. ධර්ම රත්නයෙහි සඳහන් ඕපනයික ගුණය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
(1) එන්න බලන්න යැයි ප්‍රකාශ කළ හැකි වීමයි.
(2) වෙනත් කටයුතු පසෙක තබා සිතට නගා ගැනීමට සුදුසු බවයි.
(3) කල් නොයවා ප්‍රතිඵල ලබාගත හැකි බවයි.
(4) මෙලොවදීම ප්‍රතිඵල ලබාගත හැකි බවයි.

06. පිරිත් පිංකමේදී වැඩ සිටින්නට පනවන ආසන පිටුපසින් අතු කිහිපයක් සහිත පුවක් පැළයක් තබා සකසන්නේ,
(1) වලයම (2) අවාන (3) පිරිත් ප්‍රාය (4) රාජගහ

07. බුදුරජාණන් වහන්සේ උතුම් ඥාණ අටකින් ද, චරන ධර්ම පහළොවකින් ද සමන්විත වන බැවින් බුදුරජාණන් වහන්සේ,
(1) සම්මා සම්බුද්ධ වන සේක. (2) විජ්ජාචරන සම්පන්න වන සේක
(3) සුගත වන සේක (4) ලෝකවිදූ වන සේක

08. බුදු සසුනෙහි ධර්ම සේනාධිපති තනතුර හිමි වූයේ,
(1) ආනන්ද හිමිට ය. (2) සැරියුත් හිමිට ය.
(3) මුගලන් හිමිට ය. (4) දේවදත්ත හිමිට ය.

09. ආනන්තරීය පාප කර්මයක් නොවන්නේ මින් කුමක් ද?
(1) මව මැරීම (2) පියා මැරීම (3) භික්ෂු මැරීම (4) සංඝ භේදය

10. ත්‍රිවිධ පුන්‍ය ක්‍රියාවට අයත් නොවන අංගය මින් කුමක් ද?
(1) දානය (2) සමාධි (3) සීල (4) භාවනා

11. බුදු රජාණන් වහන්සේගේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය තමන් වහන්සේ විසින් අවබෝධ කොටගෙන ලොවට පහපත පිණිස දේශණා කළ බැවින්,
(1) අරහං නම් වන සේක. (2) සුගත නම් වන සේක.
(3) සම්මා සම්බුද්ධ නම් වන සේක. (4) බුද්ධ නම් වන සේක.

12. “බොරුකීම කැතමය - ගැරඬි කණටත් නොසම ය” මෙම පද්‍ය කණ්ඩය ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?
(1) ලෝවැඩ සඟරාව (2) සුභාෂිතය (3) සිරිත් මල්දම (4) ලෝකෝපකාරය

13. “යමෙක් මුලදී පමාවී පසුව නුවණින් යුතුව නොපමාව කටයුතු කරන්නේ නම් හෙතෙම වළා ගැබෙන් මිදුණු සඳ මෙන් බබලයි.” යන අදහස ඇතුළත් ධම්ම පද ගාථාව කුමක් ද?
(1) අක්කොච්චිමං අජිනි මං (2) යෝච පුබ්බේ සමජ්ජිත්වා
(3) යස්ස පාපං කථං ධම්මං (4) නතං කම්මං කතං සාධු

14. භුක්තානුමෝදනාව යනු කුමක් ද?
(1) මතක බණ (2) දාන ආනිසංස බණ
(3) මංගල වස්ථාවෙහි දේශිත බණ (4) කඨිනානිසංස බණ

15. උපතිස්ස පිරිවැජියා සෝවාන් වූයේ කවර ගාථාවක් ඇසීමෙන්ද?
(1) යේ ධම්මා හේතු පබවා (2) සෝමේ ආචාරියෝ ආසි
(3) සබ්බ පාපස්ස අතරණං (4) නත්ථි මේ සරණං අඤ්ඤං

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.

01. (i) නන්ද කුමාරයාට විවාහ වීමට යෝජනා කර තිබුණේ කවුද?
(ii) ගාථාවක් කටපාඩම් කරගත නොහැකිව සිට පසුව මහරහතන් වහන්සේ නමක් වූ භික්ෂුව කවුද?
(iii) බුදුරජාණන් වහන්සේගෙන් පංචවරය ඉල්ලුවේ කවුද?
(iv) බුදුරජාණන් වහන්සේගේ ඇවෑමෙන් පසු ශාසනයේ ශාස්තෘවරයා වන්නේ කවුද?

02. (i) බුදුගුණ මෙනෙහි කරමින් කරන භාවනාව කුමක් ද?
(ii) බුදුගුණ භාවනාව වඩන අයුරු කෙටියෙන් ලියන්න.
(iii) බුදුගුණ භාවනාවේ ආනිශංස පහක් ලියන්න.

03. (i) බුද්ධ චරිතයෙන් හෙළිවන ආචාරශීලී ගුණාංග දෙකක් ලියන්න.
(ii) ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න.
(iii) දෙව්දත් හිමියන්ගේ සංචරව යාචනය ලියන්න.

04. (i) ධර්මරත්නයට වඳින ගාථාව ලියන්න.
(ii) ඉන් ගුණ තුනක් තේරුම සමඟ ලියන්න.
(iii) අවමංගල චාරිත්‍ර තුනක් විස්තර කරන්න.

05. පහත සඳහන් අවස්ථා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) ප්‍රජාපතී ගෝතමී දේවිය
(ii) සරණ මංගල්‍යය
(iii) ආගන්තුක සත්කාරය
(iv) ධම්ම පදය